# සක් දෙවිඳුගේ පැවැත්ම

ඉන්ද්‍රියානුභූතවාදයෙහි හෙවත් යථානුභූතවාදයෙහි පුරෝගාමියකු වූ අර්නස්ට් මාක් විද්වතා කුමක් කීවද, බටහිර විද්‍යාවේ දී කෙරෙන්නේ ඉන්ද්‍රිය ගෝචර සංසිද්ධි ඉන්ද්‍රිය ගෝචර හෝ ගෝචර නොවන හෝ සංකල්ප ඇසුරෙන් විස්තර කිරීම ය. මාක් විද්වතා බටහිර භෞතික විද්‍යාව සම්බන්ධයෙන් ගත්කල ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප යොදාගැනීමට විරුද්ධ විය. බටහිර විද්‍යාව ද ඇතුළු බටහිර දැනුමෙහි ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප යොදාගැනෙන බව පැහැදිලි ය. ගුරුත්වාකර්ෂණය එයට හොඳම උදාහරණය වෙයි.

සංකල්පයක් එක්කෝ ඉන්ද්‍රිය ගෝචර විය හැකි ය. නැත්නම් ඒ ඉන්ද්‍රිය ගෝචර නොවිය හැකි ය. ඉන්ද්‍රිය ගෝචර සංකල්ප පිලිබඳ බොහෝ දෙනාට එතරම් ප්‍රශ්නයක් නැත. ඒ සංකල්පවලින් පවතින දෙයක් කියැවෙන්නේ යැයි ඔවුහු විශ්වාස කරති. එහෙත් ථෙරවාදීන් ඇතුළු බොහෝ බෞද්ධයනට ඉන්ද්‍රිය ගෝචර සංකල්ප ද ප්‍රශ්නයක් වෙයි. ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප පිලිබඳ ඒ ඒ ගුරුකුලවල විවිධ මතිමතාන්තර වෙයි. ඒ පවතින්නේ ද නැත් ද? නොපවතින්නේ නම් අප ඒ යොදාගන්නේ කෙසේ ද? නොපවතින්නක් එලෙස අපට යොදාගත හැකි ද?

ඇතැමුනට ඇතැම් ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප ද පවතියි. කලින් සඳහන් කළ ගුරුත්වාකර්ෂණය එයට හොඳ ම උදාහරණයකි. අද තාරකා භෞතික විද්‍යාවෙහි කතාකරන අඳුරු පදාර්ථ (dark matter) එයට තවත් උදාහරණයකි. අඳුරු පදාර්ථ ඉන්ද්‍රිය ගෝචර නොවන නමුත් ඒ පවතින්නේ යැයි බොහෝ තාරකා භෞතික විද්‍යාඥයෝ විශ්වාස කරති. ක්වොන්ටම් භෞතිකයෙහි හා අදාළ ක්‍ෂෙත්‍රවල ද මේ සඳහා උදාහරණ වෙයි. ඉලෙක්ට්‍රෝන ආදී මූලික අංශු (fundamental particles) ඇතැයි න්‍යෂ්ටික භෞතික විද්‍යාඥයෝ ද වෙනත් අය ද විශ්වාස කරති. එහෙත් එවැනි අංශු ඉන්ද්‍රිය ගෝචර නැත. එසේ වුවත් ඒ සංකල්ප වෙනත් ඉන්ද්‍රිය ගෝචර සංසිද්ධි සමග සංගත වෙයි.

ඇතැමුනට ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප හුදු ආයුධයක් (උපකරණයක්) පමණකි. ඒ සංකල්පවලින් දක්වන කිසිවක් නො පැවතුණ ද ඉන්ද්‍රිය ගෝචර සංසිද්ධි තේරුම්ගැනීමේ දී ඒ යොදාගත හැකි යැයි ඔවුහු විශ්වාස කරති. එය මාක් විද්වතාගේ ක්‍රමයට ඉඳුරා පටහැණි ය. ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්ප හමුවේ අපට ඇති අනෙක් විකල්පය නම් ඒ නොපවතින බවත් ඒ බටහිර විද්‍යාවේ සංසිද්ධි, එනම් ඉන්ද්‍රිය ගෝචර සංසිද්ධි තේරුම් ගැනීමට හෝ යොදානොගත යුතු බවත් පැවසීම ය.

බටහිරයන් ඉන්ද්‍රිය ගෝචර සංසිද්ධි පිළිබඳ දක්වන ආකල්ප හේතුකොටගෙන විවිධ ප්‍රශ්නවලට මුහුණපාන බව පැහැදිලි ය. ඔවුන් එක් පැත්තකින් පංචේන්ද්‍රිය ගෝචරභාවය මත පදනම් ව පැවැත්ම තීරණයකිරීමත් අනෙක් පැත්තෙන් ඉන්ද්‍රිය ගෝචර නොවූ දෙවියන් වහන්සේ කෙනකුගේ සදාකාලික පැවැත්මක් ගැන කතාකිරීමත් හේතුකොටගෙන මේ ප්‍රශ්න පැනනගී. පැවැත්ම ඉන්ද්‍රිය ගෝචර ද නැත් ද යන්නට සතුටුදායක සංගත පිළිතුරක් බටහිර සංස්කෘතියෙන් ලබාගැනීමට නො හැකි ය.

සිංහල බෞද්ධයනට මනස ද ඉන්ද්‍රියක් වෙයි. මනස අනෙක් ඉන්ද්‍රිය සමග එකතුව ද නැතිව ද නිර්මාණය කරන සංකල්ප ඔස්සේ ලෝකය දකියි (නිර්මාණය කරයි). එහි පැවැත්ම පිළිබඳ ප්‍රශ්නයක් නැත්තේ මනස නිර්මාණය කරන කිසිවක් (මනස ද ඇතුළුව) නොපවතින බැවිනි. එබැවින් ඉන්ද්‍රිය ගෝචර දැ පමණක් පවතින්නේ ද නැත් ද යන්න ප්‍රශ්නයක් නො වෙයි. පැවැත්ම යන්න ද සම්මුති සත්‍යයක් පමණකි. පවතින්නේ ද සම්මුතියෙන් ය.

සක් දෙවිඳු පංචේන්ද්‍රියයන්ට ගෝචර නො වෙයි. එහෙත් සක් දෙවිඳු ඇතැමුන්ගේ මනසට ගෝචර වෙයි. එසේ ගෝචර වන්නේ ඇතැම් අයට පමණක් වන බැවින් බටහිර විද්‍යාවට ඒ පිළිබඳ පුනරාවර්ත පර්යේෂණ ආදිය කළ නො හැකි ය. එහෙත් මෙහි දී ද කිවයුත්තක් වෙයි. පුනරාවර්ත පර්යේෂණ අද අනෙක් ක්‍ෂෙත්‍රවල ද කළ හැක්කේ සීමිත පිරිසකට පමණ ය. හබල් දුරේක්‍ෂය මගින් කරන නිරීක්‍ෂණ අපට කළහැකි නො වෙයි. ඒ නිරීක්‍ෂණ කළ හැක්කේ හබල් දුරේක්‍ෂය යම් කාල සීමාවකට හෝ ලබාගත හැකි තාරකා භෞතික විද්‍යාඥයන්ට පමණ ය. හබල් දුරේක්‍ෂය

© Prof. Nalin De Silva

ලබාගැනීම සඳහා පළමුව නිරීක්ෂක තාරකා භෞතික විද්‍යාඥයකු ලෙස පුහුණුව ලැබිය යුතු ය. දෙවනුව ඒ දුරේක්ෂය ලබාගත හැකි ආයතනයක රැකියාවක් ලබාගත යුතු ය. තුන්වැනුව ඒ සඳහා කාලය ලබාගත හැකි ව්‍යාපෘතියක් ඉදිරිපත් කළ යුතු ය.

එයට අමතරව තවත් අවශ්‍යතා සපුරාලිය යුතු නමුත් ඉහත සඳහන් කරුණු අනිවාර්ය වෙයි. ඒ අවශ්‍යතා සපුරාලන්නන් ලෝකයේ ඇත්තේ කොපමණ ද? ඕනෑම අයකුට ඕනෑම නිරීක්ෂණයප් හෝ පරීක්ෂණයක් හෝ නැවත කළහැකි විය යුතු යැයි පැවසීම ඒ අයුරින් ගතහොත් අර්ථශූන්‍ය වෙයි. එහෙත් බටහිර විද්‍යාඥයන් හා බටහිර විද්‍යාවේ දාර්ශනිකයන් එහිදී කියන්නේ ඕනෑම අයකුට එසේ කිරීමට ශක්‍යතාවක් ඇති බව ය. එය වුවද එතරම් නිවැරදි නොවුවත් (නිරීක්ෂක තාරකා භෞතික විද්‍යාඥයකු වීමට සෑම අයකුට ම ශක්‍යතාවක් වේ ද?) අපි එය තර්කය සඳහා පිළිගනිමු.

බටහිර විද්‍යාඥයන් එවැනි ශක්‍යතා ගැන කතාකළ ද, මනස සම්බන්ධ කරුණුවල දී එවැනි ශක්‍යතා පිළිගැනීමට ඔවුහු අකමැති වෙති. සක් දෙවිඳු ගෝචර වන්නේ ඉතා ටික දෙනකුට පමණක් යැයි ද ඔවුන් ඒ සඳහා මනස වර්ධනය කරගත් පුද්ගලයන් වියයුතු යැයි ද කී විට බටහිර විද්‍යාඥයන්ට ඒ සමග එකඟ වීමට නොහැකි ය. ඕනෑම අයකුට මනස වර්ධනය කරගැනීමේ ශක්‍යතාවක් ඇතැයි කීමට ඔවුන්ගේ දිව නො නැමෙයි. එහෙත් ඉන්ද්‍රිය ගෝචර නොවන දෙවියන් වහන්සේගේ පැවැත්ම පිළිගැනීම ඔවුන්ට ප්‍රශ්නයක් නො වෙයි.

එයට හේතුවක් නම් මනස පිළිබඳ වර්ධිත ප්‍රවාද බටහිරයන් සතු නො වීම ය. බටහිරයන් මනස ගැන කතාකිරීමට පටන්ගෙන එතරම් කාලයක් නැත. එපමණක් නොව ඔවුන් මනස අධ්‍යයන කරන්නේ ද නිව්ටෝනීය සුසමාදර්ශයෙහි ය. මනස සම්බන්ධයෙන් පර්යේෂණ කරන්නේ කෙසේ දැයි ඔවුනට නො තේරෙයි. ඔවුන් ඉතා මෑතක් වන තුරුම. (බොහෝ දෙනකු අද පවා) සිතන්නේ මනසක් ඇත්තේ මිනිසුන්ට පමණක් බව ය. සතුන්ට මනසක් නැතැයි බටහිරයන්ගෙන් අති විශාල බහුතරයක් අදත් විශ්වාස කරන්නේ බයිබලය සතුන්ට ඉතා පහත් මට්ටමකින් සලකන බැවිනි. සතුන්ට මනසක් ඇතැයි අද පවා බටහිර විශ්වාස කරන්නේ බටහිර සත්ව විද්‍යාඥයන්ගෙන් ඉතා සුළු පිරිසක් පමණකි.

බටහිර මනස ගැන අධ්‍යයන කරන්නන් විවිධ මාර්ග අනුගමනය කරන අය බව පැහැදිලි ය. ඔවුන් අතර මනෝ විද්‍යාඥයන්, මනෝ විශ්ලේෂකයන්, මානසික වෛද්‍යවරුන් ආදී පිරිස් දැකගත හැකි ය. ෆ්‍රොයිඩ්, ලකාන් ආදී විද්වත්හු බටහිර විද්‍යාව සඳහන් කරන ආකාරයේ පර්යේෂණ නො කරති. ඔවුන් බොහෝ විට ප්‍රවාද ලෙස ඉදිරිපත් කරන්නේ ඔවුන්ගේ හිතළු ය. මේ ඇතැම් හිතළු විහිළුවලට වඩා වෙනසක් නැත. එහෙත් මෙරට මේ හිතළු අනුකරණය කිරීමට ද පිරිසක් සිටිති. බටහිර විද්‍යාවන් අනුගමනය කරමින් නිව්ටෝනීය සුසමාදරාශයෙහි ගොඩ නැගිය හැකි මනස පිළිබඳ විද්‍යාවක් නැත.

මනස ගැන බටහිරයන් කියන දේ අපට වැදගත්කමක් නැත. සක් දෙවිඳු සමග සන්නිවේදනය කළවුන් එසේ කරන්නට ඇත්තේ හුදු මනසින් පමණක් බවත් මනස ඒ සඳහා වර්ධනය කළ හැකි බවත් අපි විශ්වාස කරමු. එහෙත් ඕනෑම අයකුට එසේ කළහැකි යැයි අපි නො කියමු. ඒ සඳහා වාසනාව යැයි සිංහල සාහිත්‍යයේ හැඳින්වෙන්න අවශ්‍ය වෙයි. ඒ ලොතරැයි ඇදීම වැනි වාසනාවක් නම් නොවන බව කිවයුතු ය.

සක් දෙවිඳුගේ පැවැත්ම අපට එවැනි පැවැත්මක් ලෙස ද ගතහැකි ය. එවිට අපට සක් දෙවිඳු එතුමාට ම ආවේණික වූ පැවැත්මක් ඇත්තෙක් වෙයි. එබැවින් ගුත්තිලයෙහි සඳහන් සක් දෙවිඳු ගුත්තිල පඬිතුමා හමුවීම අපට ඊනියා අධියථාර්ථවාදයක්, ඉන්ද්‍රජාලික යථාර්ථවාදයක් හෝ වෙනත් යථාර්ථවාදයක් හෝ උපක්‍රමයක් හෝ නොව පටිච්චසමුප්පන්න වුවක් පමණකි. ගුත්තිල පඬිතුමාට ප්‍රශ්නයක් ඇතිවිය. ඒ විසඳාගැනීමට එතුමාට තනිව නොහැකි විය. එහෙත් එතුමා සසර පින්කළ වාසනාවන්තයෙහි ; බෝසතාණන් වහන්සේ කෙනෙකි. එවැන්නන් කරදරයට පත්වූ විට සක් දෙවිඳුගේ පඬුපුල් අසුන රත්වෙයි. සක් දෙවිඳු මනුලොව පැමිණ අදාළ පුද්ගලයාට උපකාර වෙයි. ඒ සඳහා සක් දෙවිඳුට අදාළ පුද්ගලයා සමග සන්නිවේදනය කිරීමට ඒ පුද්ගලයාගේ මනස වර්ධනය වී තිබිය යුතු ය.

© Prof. Nalin De Silva

අප ද සසර පින්කළ වාසනාවන්තයන් නම්, යහපත් පුරුෂයන් නම්, අපට ද  වර්ධනය වූ මනසක් ඇත්නම් ඇතැම් විට අපේ කරදරයක දී සක් දෙවිඳු අපට පිහිටවීමට ඉඩ ඇත. අද එතුමා අපට උපකාර නොකරන්නේ අප කිසිවකුවත් ඒ සඳහා සූදානම් නැති බැවින් විය හැකි ය. ඒ අපට ගැටළුවක් නො වෙයි. අවුරුදු දහසකට එක් දවසක්වත් සක් දෙවිඳු මනුෂ්‍ය ලෝකයට නො පැමිණියත් අපට ඒ ප්‍රශ්නයක් නො වෙයි.

සක් දෙවිඳු සම්බන්ධයෙන් අපි විවරණ කිහිපයක් කෙළෙමු. සක් දෙවිඳු මුණ ගැසීම යනු නව මානසික තත්වයක් ඇතිවීම යැයි අපට අවශ්‍ය නම් කිවහැකි ය. සක් දෙවිඳු යන්න එහි දී සංකේතයක් බවට පත්වෙයි. සක් දෙවිඳු යනුවෙන් පවතින්නෙක් නැත. එහෙත් අපි ඒ සංකේතයක් ලෙස යොදාගන්නෙමු. දෙවනුව සක් දෙවිඳු නො පැවතුණ ද අපි ඒ උපකරණයක් ලෙස යොදාගනිමු. ගුරුත්වාකර්ෂණය නොපවතියි. එහෙත් පොළොවට පොල් වැටීම තේරුම් ගැනීමට ඒ උපකාර වෙයි. ගුත්තිල පඬිතුමා වැන්නන්ගේ මනෝභාව තේරුම් ගැනීමේ දී සක් දෙවිඳු ප්‍රවාදය අපි යොදා ගනිමු.  ඒ ඉන්ද්‍රිය ගෝචර නොවන සංකල්පයක් මුල්කරගත් ප්‍රවාදයක් බවට පත්වෙයි. තුන්වැනුව සක් දෙවිඳු යනු එකල යම් රටක රජ කළ බලවත් රජ කෙනකු වටා ගෙතුණු ඊනියා ජනප්‍රවාදයක් වෙයි. ජනප්‍රවාද ද ප්‍රවාද මෙන් ම කතන්දර වෙයි. එහි වෙනස නම් ප්‍රවාද විදග්ධයන් ගොතන කතාවීමත් ජනප්‍රවාද සාමාන්‍ය ජනයා ගොතන කතා වීමත් ය. ඇතැමුන් සක් දෙවිඳු යනු ඩේරියස් රජු යැයි විශ්වාස කරන්නේ ඒ පදනමෙන් ය. හතරවැනුව සක් දෙවිඳු දැනටත් ජීවත්වන සදෙව්ලොවට අධිපතියා වෙයි. සක් දෙවිඳු ඉඳහිට මනුලොව පැමිණ ගුත්තිල පඬිතුමා වැන්නන්ට උපකාර කරයි.

සිංහල බෞද්ධයන්ට මේ විවරණ එකක්වත් ප්‍රශ්නයක් නො වෙයි. සක් දෙවිඳුගේ පැවැත්ම පිළිබඳ අර්ථකථන සිංහල බෞද්ධයනට ප්‍රශ්නයක් නොවන්නේ කිනම් පැවැත්මක් වුව ද හුදු සම්මුතියක් පමණක් වන බැවිනි. ඒ එකක්වත් අපට ඊනියා යථාර්ථයක් නො වේ. ඒ අධි යථාර්ථයක් හෝ ඉන්ද්‍රජාලික යථාර්ථයක් හෝ ද නො වෙයි. යථාර්ථයක් නැති කල අධියථාර්ථයක් හෝ ඉන්ද්‍රජාලික යථාර්ථයක් හෝ ද නැත. සක් දෙවිඳුට අඩුම තරමින් සම්මුති පැවැත්ම හතරක් ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva